සැ. යු. -2010.04.23 දින පළ වූ අංක 1,649 දරන ගැසට් පත්‍රයේ  II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,652 - 2010 අප්‍රේල් මස 30 වැනි සිකුරාදා - 2010.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 848 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 මැයි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අප්‍රේල් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

847- B 79855—3,350 (2010/04)
A1–

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ දෙසැම්බර් මස 16 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් අයුරු විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී, මින් පෙර නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එම්. එන්. කේ රත්නායක මහත්මිය විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2002.02.15 වැනි දින අංක 514, වර්ෂ 2004.08.19 දින අංක 1025 දරන බැඳුම්කර සහ ප්‍රසිද්ධ නොතාරිස් සී. එන්. සමරවික්‍රම මහත්මිය විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2007.03.29 දින අංක 703 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, මාවනැල්ල දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ නිසි පරිදි ලියාපදිංචි කරන ලද සමාගමක් වන රත්සිරි කන්ෆැක්ෂනරි (ප්‍රයිවට්) ලිමිටඩ් (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තවද මෙහි පහත විස්තර කර ඇති නිදහස් දේපළේ සහ පරිශ්‍රයෙහි අයිතිකරු සහ කළමණාකාර අධ්‍යක්ෂ වන ගල්හේන ගමගේ රත්නසිරි විසින් සිය නිදහස් අයිතිවාසිකම් සහ බලපුළුවන්කාරකම් එකී බැඳුම්කර මගින් බැංකුවට උකස් කර ඇති හෙයින් ද,

තවද වර්ෂ 2009ක් වූ නොවැම්බර් මස 30 වැනි දිනට එකී බැඳුම්කර යටතේ බැංකුවට රුපියල් එක්කෝටි දහතුන් ලක්ෂ පනස් නම දහස් එකසිය අනූතුනයි ශත අසූ දෙක (රු. 1,13,59,193.82) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින් බැවින් ද,

1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනතින් සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් එක්කෝටි දහතුන් ලක්ෂ පනස් නමදහස් එකසිය අනූ තුනයි ශත අසූ දෙක (රු. 1,13,59,193.82) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2009ක් වූ දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී අංක 514 දරන බැඳුම්කරය යටතේ රුපියල් අසූතුන් දහස් හාරසියය (රු. 83,400) ක මුදලක් මත වසරකට සියයට දහඅට (18%) ක පොළිය ද, එකී අංක 1025 දරන බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ අනූ අට දහස් හයසිය පනස් එකයි ශත අසූ දෙකක (රු. 7,98,651.82) මුදලක් මත වසරකට සියයට දාසයයි දශම පහ (16.5%) ක පොළිය ද සහ එකී අංක 703 දරන බැඳුම්කරය යටතේ රුපියල් හැට හතර ලක්ෂ අනූ හත් දහස් හයසිය තිස් හතයි ශත අසූ හතර (රු. 64,97,637.84) ක මුදලක් මත වසරකට සියයට විසිපහයි දශම හතයි පහ (25.75%) ක පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය ඇතුළුව නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු වූ පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

1. සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ කෝරළේ, එගොඩපොත තනිප්පේරු පත්තුවේ, පැදිදොර හි පිහිටි කුරුම්බැව්ලේ හේන යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. බී. රණතුංග විසින් සාදන ලද 1985.05.20 දින අංක 2629 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන්කළ ලොට් 14 දරන ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : එකී පිඹුරේ ලොට් 13 ලෙස සලකුණු කොට ඇති පොදු පාරෙන් ද, නැගෙනහිරට : අරණායක මාවනැල්ල පාරෙන් ද, දකුණට : එකී පිඹුරේ ලොට් 15න් සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 16 ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20)ක ඉඩම වන අතර, මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C550/264හි ලියාපදිංචි වී ඇති අතරම ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ ඒ තුළ දැනට සහ මින්මතුවට ස්ථිරවම සවිකර ඇති හෝ සවිකරන සෑම සහ සියලු දේද වේ.

2. ඉහත පැදිදොර හි පිහිටි කුරම්බැව්ලේ හේන නමින් හඳුන්වනු ලබන ඉහත අංක 2629 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන්කළ ලොට් 15 දරන ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : එකී පිඹුරේ ලොට් 14 ද, නැගෙනහිරට : අරණායක මාවනැල්ල පාරෙන් ද, දකුණට : එකී පිඹුරේ ලොට් 34න් සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 16 සහ 33 ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක ඉඩම වන අතර, මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C550/265හි ලියාපදිංචි වී ඇති අතරම ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ ඒ තුළ දැනට සහ මින්මතුවට ස්ථිරවම සවිකර ඇති හෝ සවිකරන සෑම සහ සියලු දේද වේ.

3. ඉහත පැදිදොර හි පිහිටි කුරුම්බැව්ලේ හේන නමින් හඳුන්වනු ලබන ඉහත කී අංක 2629 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන්කල ලොට් 34 දරන ඉඩම් කොටසට මායිම්, එනම්, උතුරට : එකී පිඹුරේ ලොට් 15 ද, නැගෙනහිරට : අරණායක මාවනැල්ල පාරෙන් ද, දකුණට : එකී පිඹුරේ ලොට් 35න් සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 33 යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක ඉඩම වන අතර මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 550/226හි ලියාපදිංචි වී ඇති අතරම ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ ඒ තුළ දැනට සහ මින්මතුවට ස්ථිරවම සවිකර ඇති හෝ සවිකරන සෑම සහ සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

04-606

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.